<u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් කරනු ලබන නිවේදනයයි.</u>

**විශ්වවිද්‍යාල ප්‍රවේශය -2013/2014 අධ්‍යයන වර්ෂය**
**(2013 වර්ෂයේ අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව)**

2013 වර්ෂයේ අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් තෝරා ගැනීමට සුදුසු නිර්ණායක සකස් කිරීම පිණිස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද විද්වත් කමිටුවේ නිර්දේශය අනුව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ (වරින් වර සංශෝධිත) 15(VII) වගන්තිය ප්‍රකාරව ප්‍රවේශ කමිටුවේ එකඟතාවය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි ඉහත අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් තෝරා ගැනීමේදී පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මූලික අයිතිවාසිකම් නඩු අංක 418/2012 දරන තීන්දුවට අදාළව කරන ලද නිර්දේශ මත 2013.03.01 දිනැති අංක 13/0205/521/008 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ දැක්වෙන කාණ්ඩවලට පමණක් අයත් වන අ.පො.ස (උසස් පෙළ) විභාගයට 2013 වර්ෂයේදී සිවුවන වතාවට පෙනී සිටි සිසුන් 2013/2014 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සළකා බලනු ලැබේ.

2) 2013 අ.පො.ස (උසස් පෙළ) විභාගයට නව නිර්දේශය සහ පැරණි නිර්දේශය යටතේ පෙනී සිටි සිසුන් වෙන වෙනම ජනගහන දෙකක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී සළකනු ලැබේ.

3) එක් එක් උපාධි පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල මගින් බඳවා ගැනීමට නියමිත මුළු ස්ථාන සංඛ්‍යාව, 2013 අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් ලබා 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා නිකුත් කිරීමට නියමිත ප්‍රවේශ අත්පොතට අනුව එක් එක් උපාධි පාඨමාලාව සඳහා ප්‍රවේශ වීමට අවශ්‍ය විෂය පූර්ව අවශ්‍යතා සපුරාලූ නව විෂය නිර්දේශයට හා පැරණි විෂය නිර්දේශයට අයත් ශිෂ්‍ය සංඛ්‍යාවේ අනුපාතය අනුව බෙදා දෙනු ලැබේ.

4) ඉහත 3 ඡේදයට අනුව තෝරා ගන්නා සිසුන් අතර ඉහත 1ඡේදයේ දැක්වෙන පරිදි සිවුවන වතාවට අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් වෙතොත්, පළමු දෙවන සහ තෙවනවරට අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සිසුන්ගේ අයිතීන් උල්ලංඝණය නොවීම පිණිස, ඒ එක් එක් සිසුවෙකු වෙනුවෙන් ඊළඟ ලකුණු මට්ටමේ සිටින සිසුන් බඳවා ගනු ලබන අතර එසේ සිවුවන වතාවට පෙනී සිටි සිසුන්, යෝජිත ස්ථාන සංඛ්‍යාවට පරිබාහිරව අතිරේක සිසුන් ලෙස බඳවා ගනු ලැබේ.

ලේකම්
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
නො 20, වෝඩ් පෙදෙස
කොළඹ 07
2013.12.17